# ශ්‍රී බුද්ධ වර්ෂ 2560-2561

# රාජ්‍ය වර්ෂ 2017



# බුදුසරණ

## දෙළොස් මහේ පොහොය වරුණ

### දුරුතු පසළොස්වක පොහොය

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ ඓතිහාසික දුරුතු පෝ දිනකය. තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සව්වන් සදහම් මඟට හරවා ඔවුන් හැම අරී සඟ ගණ බවට පත්කොට වදළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම් තැන්නේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරු දනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදුරැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

### නවම් පසළොස්වක පොහොය

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුන් පොහෝ දිනකය.

### මැදින් පසළොස්වක පොහොය

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත්පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදකය.

### බක් පසළොස්වක පොහොය

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි, බක් පොහොය දිනය. මේ සුන්දර දිවයින දෙවැනිවරට බුදුසිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේද, දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද බක් පුර පොහෝ දිනකදීය.

### වෙසක් පසළොස්වක පොහොය

තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසි බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනයයි.

### පොසොන් පසළොස්වක පොහොය

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවිඩය රැගෙන වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් දිනයයි.

## 2017 පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **දුරුතු මස පෝය** | | | | | | | | |
| ජන. 05 | බ්‍රහස්. | අ.භා. | 02.00 න් | පුර අටවක ලබා | 06 සිකුරාද | අ.භා. 12.25 | න් ගෙවේ. | බ්‍රහස්. සිල් |
| ජන. 11 | බදාදා | අ.භා. | 07.51 න් | පසළොස්වක ලබා | 12 බ්‍රහස් | අ.භා. 05.03 | න් ගෙවේ. | බ්‍රහස්. සිල් |
| ජන. 19 | බ්‍රහස්. | අ.භා. | 02.37 න් | අව අටවක ලබා | 20 සිකුරාද | අ.භා. 04.54 | න් ගෙවේ. | බ්‍රහස්. සිල් |
| ජන. 27 | සිකුරා. | පූ.භා. | 05.01 න් | අමාවක ලබා | 28 සෙනසු. | පූ.භා. 05.36 | න් ගෙවේ. | සිකුරා. සිල් |
| **නවම් මස පෝය** | | | | | | | | |
| පෙබ. 03 | සිකුරා. | අ.භා. | 10.49 න් | පුර අටවක ලබා | 04 සෙනසු. | අ.භා. 08.44 | න් ගෙවේ. | සෙනසු. සිල් |
| පෙබ. 10 | සිකුරා. | අ.භා. | 07.30 න් | පසළොස්වක ලබා | 11 සෙනසු. | පූ.භා. 06.02 | න් ගෙවේ. | සිකුරා. සිල් |
| පෙබ. 18 | සෙනසු. | අ.භා. | 11.48 න් | අව අටවක ලබා | 19 ඉරිදා | අ.භා. 02.18 | න් ගෙවේ. | සෙනසු. සිල් |
| පෙබ. 25 | සෙනසු. | පූ.භා. | 09.20 න් | අමාවක ලබා | 26 ඉරිදා | අ.භා. 08.28 | න් ගෙවේ. | ඉරිදා. සිල් |
| **මැදින් මස පෝය** | | | | | | | | |
| මාර්තු 05 | ඉරිදා | පූ.භා. | 06.07 න් | පුර අටවක ලබා | 06 සඳුදා | පූ.භාග 03.39 | න් ගෙවේ. | ඉරිදා. සිල් |
| මාර්තු 11 | සෙනසු. | අ.භා. | 08.23 න් | පසළොස්වක ලබා | 12 ඉරිදා | අ.භා. 08.23 | න් ගෙවේ. | ඉරිදා. සිල් |
| මාර්තු 20 | සඳුදා | පූ.භා. | 08.19 න් | අව අටවක ලබා | 21 අඟහ. | පූ.භා. 10.31 | න් ගෙවේ. | සඳුදා. සිල් |
| මාර්තු 27 | සඳුදා | පූ.භා. | 10.44 න් | අමාවක ලබා | 28 අඟහ. | පූ.භා. 08.27 | න් ගෙවේ. | සඳුදා. සිල් |
| **බක් මස පෝය** | | | | | | | | |
| අප්‍රේල් 03 | සඳුදා | අ.භා. | 01.05 න් | පුර අටවක ලබා | 04 අඟහ. | පූ.භා. 11.20 | න් ගෙවේ. | සඳුදා. සිල් |
| අප්‍රේල් 10 | සඳුදා | පූ.භා. | 10.22 න් | පසළොස්වක ලබා | 11 අඟහ. | පූ.භා. 11.38 | න් ගෙවේ. | සඳුදා සිල් |
| අප්‍රේල් 19 | බදාදා | පූ.භා. | 02.37 න් | අව අටවක ලබා | 20 බ්‍රහස්. | පූ.භා. 04.06 | න් ගෙවේ. | බදාදා. සිල් |
| අප්‍රේල් 25 | අඟහ. | අ.භා. | 09.08 න් | අමාවක ලබා | 26 බදාදා | අ.භා. 05.46 | න් ගෙවේ. | බදාදා. සිල් |
| **වෙසක් මස පෝය** | | | | | | | | |
| මැයි 02 | අඟහ. | අ.භා. | 08.51 න් | පුර අටවක ලබා | 03 බදාදා | අ.භා. 07.51 | න් ගෙවේ. | බදාදා. සිල් |
| මැයි 10 | බදාදා | පූ.භා. | 01.07 න් | පසළොස්වක ලබා | 11 බ්‍රහස්. | පූ.භා. 03.12 | න් ගෙවේ. | බදාදා. සිල් |
| මැයි 18 | බ්‍රහස්. | අ.භා. | 05.42 න් | අව අටවක ලබා | 19 සිකුරාද | අ.භා. 06.11 | න් ගෙවේ. | බ්‍රහස්. සිල් |
| මැයි 25 | බ්‍රහස්. | පූ.භා. | 05.08 න් | අමාවක ලබා | 26 සිකුරාද | පූ.භා. 01.14 | න් ගෙවේ. | බ්‍රහස්. සිල් |
| **පොසොන් මස පෝය** | | | | | | | | |
| ජූනි 01 | බ්‍රහස්. | පූ.භා. | 06.20 න් | පුර අටවක ලබා | 02 සිකුරාද | පූ.භා. 06.14 | න් ගෙවේ. | බ්‍රහස්. සිල් |
| ජූනි 08 | බ්‍රහස්. | අ.භා. | 04.16 න් | පසළොස්වක ලබා | 09 සිකුරාද | අ.භා. 06.39 | න් ගෙවේ. | බ්‍රහස්. සිල් |
| ජූනි 17 | සෙනසු. | පූ.භා. | 05.15 න් | අව අටවක ලබා | 18 ඉරිදා | පූ.භා. 04.38 | න් ගෙවේ. | සෙන. සිල් |
| ජූනි 23 | සිකුරා. | පූ.භා. | 11.50 න් | අමාවක ලබා | 24 සෙනසු. | පූ.භා. 08.00 | න් ගෙවේ. | සිකුරා. සිල් |
| **ඇසළ මස පෝය** | | | | | | | | |
| ජූනි 30 | සිකුරා. | අ.භා. | 06.00 න් | පුර අටවක ලබා | 01 සෙනසු. | අ.භා. 06.51 | න් ගෙවේ. | සෙනසු. සිල් |
| ජූලි 08 | සෙනසු. | පූ.භා. | 07.31 න් | පසළොස්වක ලබා | 09 ඉරිදා | පූ.භා. 09.36 | න් ගෙවේ. | සෙනසු. සිල් |
| ජූලි 16 | ඉරිදා | අ.භා. | 01.37 න් | අව අටවක ලබා | 17 සඳුදා | අ.භා. 12.05 | න් ගෙවේ. | ඉරිදා. සිල් |
| ජූලි 22 | සෙනසු. | අ.භා. | 06.27 න් | අමාවක ලබා | 23 ඉරිදා | අ.භා. 03.15 | න් ගෙවේ. | ඉරිදා. සිල් |
| **නිකිණි මස පෝය** | | | | | | | | |
| ජූලි 30 | ඉරිදා | පූ.භා. | 08.06 න් | පුර අටවක ලබා | 31 සඳුදා | පූ.භා. 09.47 | න් ගෙවේ. | ඉරිදා. සිල් |
| අගෝ. 06 | ඉරිදා | අ.භා. | 10.28 න් | පසළොස්වක ලබා | 07 සඳුදා | අ.භා. 11.40 | න් ගෙවේ. | සඳුදා සිල් |
| අගෝ. 14 | සඳුදා | අ.භා. | 07.45 න් | අව අටවක ලබා | 15 අඟහ. | අ.භා. 05.39 | න් ගෙවේ. | අඟහ. සිල් |
| අගෝ. 21 | සඳුදා | පූ.භා. | 02.10 න් | අමාවක ලබා | 22 අඟහ. | පූ.භා. 00.00 | න් ගෙවේ. | සඳුදා. සිල් |
| **බිනර මස පෝය** | | | | | | | | |
| අගෝ. 29 | අඟහ. | පූ.භා. | 00.36 න් | පුර අටවක ලබා | 30 බදාදා | පූ.භා. 02.52 | න් ගෙවේ. | අඟහ. සිල් |
| සැප්. 05 | අඟහ. | අ.භා. | 12.41 න් | පසළොස්වක ලබා | 06 බදාදා | අ.භා. 12.32 | න් ගෙවේ. | අඟහ. සිල් |
| සැප්. 13 | බදාදා | පූ.භා. | 01.01 න් | අව අටවක ලබා | එමදා | අ.භා. 10.48 | න් ගෙවේ. | බදාදා සිල්. |
| සැප්. 19 | අඟහ. | පූ.භා. | 11.52 න් | අමාවක ලබා | 20 බදාදා | පූ.භා. 10.59 | න් ගෙවේ. | අඟහ. සිල් |
| **වප් මස පෝය** | | | | | | | | |
| සැප්. 27 | බදාදා | අ.භා. | 07.08 න් | පුර අටවක ලබා | 28 බ්‍රහස්. | අ.භා. 09.36 | න් ගෙවේ. | බ්‍රහස්. සිල් |
| ඔක්. 05 | බ්‍රහස්. | පූ.භා. | 01.47 න් | පසළොස්වක ලබා | 06 සිකුරාද | පූ.භා. 00.10 | න් ගෙවේ. | බ්‍රහස්. සිල් |
| ඔක්. 12 | බ්‍රහස්. | පූ.භා. | 06.56 න් | අව අටවක ලබා | 13 සිකුරාද | පූ.භා. 04.59 | න් ගෙවේ. | බ්‍රහස් සිල් |
| ඔක්. 19 | බ්‍රහස් | පූ.භා. | 00.13 න් | අමාවක ලබා | 20 සිකුරාද | පූ.භා. 00.42 | න් ගෙවේ. | බ්‍රහස්. සිල් |
| **ඉල් මස පෝය** | | | | | | | | |
| ඔක්. 27 | සිකුරා. | අ.භා. | 02.45 න් | පුර අටවක ලබා | 28 සෙනසු. | අ.භා. 04.51 | න් ගෙවේ. | සිකුරා. සිල් |
| නොවැ. 03 | සිකුරා. | අ.භා. | 01.47 න් | පසළොස්වක ලබා | 04 සෙනසු. | පූ.භා. 10.52 | න් ගෙවේ. | සිකුරා. සිල් |
| නොවැ. 10 | සිකුරා. | අ.භා. | 02.50 න් | අව අටවක ලබා | 11 සෙනසු. | අ.භා. 01.30 | න් ගෙවේ. | සිකුරා. සිල් |
| නොවැ. 17 | සිකුරා. | අ.භා. | 03.29 න් | අමාවක ලබා | 18 සෙනසු. | අ.භා. 05.12 | න් ගෙවේ. | සිකුරා. සිල් |
| **උඳුවප් මස පෝය** | | | | | | | | |
| නොවැ. 26 | ඉරිදා | පූ.භා. | 09.51 න් | පුර අටවක ලබා | 27 සඳුදා | පූ.භා. 11.02 | න් ගෙවේ. | ඉරිදා. සිල් |
| දෙසැ. 03 | ඉරිදා. | පූ.භා. | 00.57 න් | පසළොස්වක ලබා | එමදා | අ.භා. 09.16 | න් ගෙවේ. | ඉරිදා. සිල් |
| දෙසැ. 10 | ඉරිදා | පූ.භා. | 01.41 න් | අව අටවක ලබා | 11 සඳුදා | පූ.භා. 01.11 | න් ගෙවේ. | ඉරිදා. සිල් |
| දෙසැ. 17 | ඉරිදා | පූ.භා. | 09.26 න් | අමාවක ලබා | 18 සඳුදා | අ.භා. 12.00 | න් ගෙවේ. | ඉරිදා. සිල් |
| **දුරුතු මස පෝය** | | | | | | | | |
| දෙසැ. 26 | අඟහ. | පූ.භා. | 02.44 න් | පුර අටවක ලබා | 27 බදාදා | පූ.භා. 02.44 | න් ගෙවේ. | අඟහ. සිල් |

## දෙළොස් මහේ පොහොය වරුණ

### ඇසළ පසළොස්වක පොහොය

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත්, නිවනත්, එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දිනයයි. ඇසළ පෝදා.

### නිකිණි පසළොස්වක පොහොය

ඇසළ අව පෑළවිය දා භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයකි. නිකිණි පසළොස්වක පොහෝදා පොහොය කොට නිකිණි අව පෑළවියදා පසුවස් එළඹීමයි. සසුන් පිළිවෙත වන්නේ.

### බිනර පසළොස්වක පොහොය

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වස් වසමින් බණ භාවනාවල යෙදෙමින් සම්බුද්ධ ශාසන පරමාර්ථ ඉටු කරගන්නා කාලයකි. මෙහෙණ සසුනේ ආරම්භය සිදු විය.

### වප් පසළොස්වක පොහොය

වස්සාන ඍතුවේ මුල් තුන් මස භික්ෂූන් වහන්සේ වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි. එය චීවර මාසය නමින්ද ව්‍යවහාර කැරේ.

### ඉල් පසළොස්වක පොහොය

ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෛත්‍රී බෝසත්තුමා විවරණය ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම, පසු වස් පවාරණය කළ යුතු දිනයද, සැරියුත් මහ රහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීමද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝදය.

### උඳුවප් පසළොස්වක පොහොය

උඳුවප් පොහොය දින සිදු වූ සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ ලංකාගමනය ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන, ලංකා මෙහෙණ සසුන ගැන සිහිකරන කවර අයකුට වුවද ඇති වනුයේ මහා සැනසිල්ලකි.

වර්ෂ 2017 ක් වූ ජනවාරි 05 වනද බ්‍රහස්පතින්ද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.